Provincial Department of Education - NWP
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

# Third Term Test - Grade 13 - 2018

**1282**

විභාග අංකය ..............................

## ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

**උපදෙස්**

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමඟ නොගැලපේ. නොගැලපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන් තුළ ලියන්න.

01. 1. ක්‍රිෂ්ණා 2. තුංගභද්‍රා 3. බ්‍රහ්මපුත්‍ර
4. කාවේරි 5. ගෝදාවරී (..3..)

02. 1. ඍතු සංහාරය 2. මාලවිකාග්නි මිත්‍ර 3. රඝු වංශය
4. මහා භාරතය 5. ශාකුන්තලය (..4..)

03. 1. මොහොන්ජොදාරෝ 2. කලිබන්ගන් 3. ලෝතාල්
4. රාමේෂ්වරම් 5. චන්හුදාරෝ (..4..)

04. 1. නාලන්දා 2. උජ්ජයිනි 3. වික්‍රමශීලා
4. ජගද්දලා 5. ඕදන්තපුරි (.....)

05. 1. ස්ට්‍රාබෝ 2. ප්ලිනි 3. කල්හාණ
4. හෙරඩෝටස් 5. ටොලමි (.....)

06. 1. පකුධ කච්චායනා 2. පූර්ණ කස්සප 3. ගෞතම බුද්ධ
4. මක්ඛලී ගෝසාල 5. අජිත කේශකම්බල (.....)

07. 1. චම්පා 2. රාජගෘහ 3. සාංචි
4. උජ්ජයිනි 5. කෞෂම්බි (.....)

08. 1. සිසුනාග 2. නන්ද 3. හර්යංක
4. පුෂ්‍යමිත්‍ර 5. මෞර්ය (.....)

09. 1. මණ්ඩප 2. ගර්භගෘහ 3. අන්තරාල
4. චෛත්‍යශාලා 5. විමාන (.....)

10. 1. ධර්මපාල 2. දේවපාල 3. ගෝපාල
4. මහේන්ද්‍රපාල 5. නාරායනපාල (.....)

www.artsapi.lk



Scanned by CamScanner

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. 1. අයිහෝල් - II පුලකේශීන්
2. ධෞලි - අශෝක
3. ජුනාගාද් - රුද්‍රාදාමන්
4. හිටරි - II චන්ද්‍රගුප්ත
5. හතිගුම්භ - ඛාරවේල (.....)

12. 1. දන්ත දේවි - සමුද්‍රගුප්ත
2. ධ්‍රැව දේවි - II චන්ද්‍රගුප්ත
3. මුරා - අශෝක
4. රාජ ශ්‍රී - ග්‍රහවර්මන්
5. කෝසල දේවි - බිම්බිසාර (.....)

13. 1. එල්ලෝරාහි කයිලාසනාථ දේවාලය - රාෂ්ට්‍රකූට
2. තංජෝර්හි බ්‍රෘහද්රය දේවාලය - චෝළ
3. බෙලූර්හි චෙන්නකේශව දේවාලය - හොයිසාල
4. ඛජුරාහෝහි කන්දරීය මහා දේවාලය - වාකාටක
5. මහබලිපුරම්හි රථ දේවාලය - පල්ලව (.....)

14. 1. ඉන්ද්‍රප්‍රස්ථ - දිල්ලි
2. සාගල - සියල්කොට්
3. ප්‍රයාග - අවුරංගබාද්
4. පුරුෂපුර - පෙෂවෝර්
5. සෞරාෂ්ට්‍ර - කතියවාර් (.....)

15. 1. කාලිංග - චේදි
2. වරංගල් - කාකටිය
3. වාතාපි - හොයිසාල
4. වලභි - මෛත්‍රිකයෝ
5. කනෞජ් - සාතවාහන (.....)

- අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුඅවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අජන්තා | A | පල්ලව රථ |
| 2. | මහාබලිපුරම් | B | හින්දු දේවාල |
| 3. | මථුරා | C | ගුහා චිත්‍ර |
| 4. | නාලන්දා | D | බෞද්ධ අධ්‍යාපන ආයතනයක් |
| 5. | තංජෝර් | E | බුද්ධ ප්‍රතිමා |

1. BEDCA 2. CAEDB 3. ADCBE 4. ECBAD 5. DBAEC (.....)

www.artsapi.lk



Scanned by CamScanner

| X | Y |
|---|---|
| 1. මස්කි සුළු ගිරි ලිපිය | A ගෞතමී බාලාශ්‍රී |
| 2. ගිටර් සෙල්ලිපිය | B ස්කන්ධ ගුප්ත |
| 3. නාසික් සෙල්ලිපිය | C දෙවෙනි පුලකේශීන් |
| 4. ජුනාගාද් සෙල්ලිපිය | D අශෝක |
| 5. අයිහෝල් සෙල්ලිපිය | E රුද්‍රදාමන් |

1. ADCBE 2. BEDCA 3.CAEBD 4. DBAEC 5. ECBAD (.....)

18.

| X | Y |
|---|---|
| 1. ව්‍යාකරණ | A සූර්ය සිද්ධාන්ත |
| 2. තාරකා ශාස්ත්‍ර | B රාජතරංගණිය |
| 3. දර්ශනය | C මහාභාෂ්‍ය |
| 4. මහා කාව්‍ය | D රඝුවංශය |
| 5. ඉතිහාසය | E සංඛ්‍යාසූත්‍ර |

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (.....)

19.

| X | Y |
|---|---|
| 1. අන්තර්වසිත | A අයකැමි |
| 2. මන්ත්‍රී - පර්ෂද් | B අමාත්‍ය මණ්ඩලය |
| 3. සමාහර්ත | C නගර පාලන |
| 4. අන්තපාල | D අන්තඃපුර පාලක |
| 5. නාගරක | E දේශසීමා ආරක්ෂක |

1. ADCBE 2. BEDCA 3. CAEDB 4. DBAEC 5. ECBAD (.....)

20.

| X | Y |
|---|---|
| 1. මිනැන්ඩර් | A වයඹදිග ඉන්දියාව පාලනය කළ ඉන්දු ග්‍රීක පාලකයෙකි. |
| 2. සන්ද්‍රාකොට්ටාස් | B ඉන්දියාව ආක්‍රමණය කළ හූණ නායකයා |
| 3. නහපාන | C චන්ද්‍රගුප්ත මෞර්ය හැඳින්වූ ග්‍රීක නාමය |
| 4. තෝරමාන | D බටහිර හා මධ්‍ය ඉන්දියාව පාලනය කළ ශක පාලකයා |
| 5. අග්‍රනොමි | E මෞර්ය ප්‍රදේශ පාලන භාරව සිටි නිළධාරියා |

1. ABECD 2. ACEBD 3. ACDBE 4. AEDBC 5. ADEBC (.....)

- **අංක 21 - 25 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.**

21. මහා නාන තටාකය පිහිටි නගරය කුමක්ද?
1. මොහොන්ජොදාරෝ 2. හරප්පා 3. ලෝතාල්
4. රූපාර් 5. කලිබන්ගන් (.....)

22. බෞද්ධ සාහිත්‍යයට අනුව ගණ රාජ්‍ය නොවන ආණ්ඩු ක්‍රමයක් පැවතියේ කොහේද?
1. කෝලිය 2. ලිච්ඡවී 3. අවන්ති
4. විදේහ 5. මල්ල (.....)

www.artsapi.lk



Scanned by CamScanner

23. සිය පියා මිය යන විට අශෝක පාලනය කරමින් සිටියේ කුමන නගරයේ ප්‍රදේශීය ආණ්ඩුකාරවරයා ලෙසද?
1. තක්ෂිලා
2. උජ්ජෙයිනිය
3. කෝසලී
4. ස්වර්ණගිරි
5. පාඨලී පුත්‍ර
(.....)

24. සතවාහන රාජ වංශයේ ආරම්භක රජ වූයේ කවුරුන්ද?
1. කෘෂ්ණ
2. ගෞතමී පුත්‍ර
3. සීමුක
4. ශ්‍රී යාඥ
5. I සාතකර්ණී
(.....)

25. හාරුකච්ඡ වරායෙන් මුහුදට ගලායන ගංගාව කුමක්ද?
1. තප්ති
2. කෘෂ්ණ
3. නර්මදා
4. කාවේරි
5. මහානදී
(.....)

- **අංක 26 - 30 දක්වා සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

26. ඉන්දු නිම්න වැසියන්ගේ සමාජ ජීවිතය
1. එහි වැසියෝ බාර්ලි, වී, තිරිඟු හා මෑ වර්ග ආදී ධාන්‍ය වගා කළහ.
2. ස්ත්‍රීහු මාළ, වළලු, මුදු ආදී ආභරණ පැළඳීම.
3. එහි වැසියෝ මව් දෙවගන වන්දනා කළහ.
4. ඉන්දු නිම්න වැසියෝ සුමේරියාවෙන් කපු ආනයනය කළහ.
5. මොහොන්ජොදාරෝවෙන් හමු වී ඇති ඇටසැකිලි අවශේෂ කැල්කොලිතික යුගයට අයත් යැයි සැලකේ.
(.....)

27. නාලන්දා විශ්ව විද්‍යාලය
1. ගුප්ත අවධියේ ආරම්භ විය.
2. මහායාන බෞද්ධ මධ්‍යස්ථානයකි.
3. පාහියං හිමි මෙහි අධ්‍යාපනය ලැබූ දීප්තිමත් ශිෂ්‍යයෙකි.
4. පාලවරුන්ගේ නොමද අනුග්‍රහය එයට ලැබිණි.
5. ජාත්‍යන්තර කීර්තියට පත් අධ්‍යාපනික මධ්‍යස්ථානයකි.
(.....)

28. මහා ඇලෙක්සැන්ඩර් අධිරාජයාගේ ඉන්දියානු ආක්‍රමණය
1. ආක්‍රමණය එල්ල වූයේ ක්‍රි.ව. හතරවන සියවසේ දී ය.
2. එවිට උතුරු වූයේ ඉන්දියාවේ පාලකයා වූයේ ධනනන්දය.
3. වයඹ දිග ඉන්දියාවට ආක්‍රමණය එල්ල වූයේ ය.
4. බියස් නදිය තරණය කර රට ඇතුළට ආක්‍රමණය එල්ල නොකලේ හමුදාවල අකමැත්ත නිසාය.
5. ඔහු ඉන්දියාවෙන් නික්ම ගියේ මක්‍රාන් දූර්ගය හරහාය.
(.....)

29. බුද්ධ ධර්මය හා ජෛන ධර්මය අතර සමානතා,
1. නිර්වාණය පිළිබඳ විශ්වාසය
2. කර්මය පිළිබඳ විශ්වාසය
3. අවිහිංසාවාදය විශ්වාස කිරීම.
4. අත්තකිලමතානුයෝගය ප්‍රගුණ කිරීම.
5. වේද ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීම.
(.....)

30. ගුප්ත යුගයේ විශිෂ්ඨ ලේඛකයන්
1. ශුද්‍රක
2. හරිසේන
3. කල්හාණ
4. භාස
5. විශාඛදත්ත
(.....)

www.artsapi.lk



Scanned by CamScanner

- අංක 31-35 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති A,B,C, හා D යන ප්‍රතිචාර හතර අතරින් එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා

A හා B පමණක් නිවැරදි නම් අංක 1 ද
B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද
C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද
A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද

**ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. අශෝක රජුගේ ආගමික ප්‍රතිපත්ති
A) රටවැසියාගේ සුව පහසුව සලකා කටයුතු කලේය.
B) අශෝක රජුගේ කාලයේ තෙවන මහායාන බෞද්ධ සංඝායනාව පැවැත්වීය.
C) රජතුමා අසූහාර දහසක් වෙහෙර විහාර කරවන ලදී.
D) අශෝක රජු ජෛන ආගමිකයෙකි. (.....)

32. 'මහා භාරතය' කාව්‍ය පිළිබඳව පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
A) මහා භාරතයේ කතුවරයා වාල්මිකී පඬිවරයා ය.
B) මෙය ලෝකයේ ඇති දීර්ඝතම තනි කාව්‍ය වන අතර වීර කාව්‍යයකි.
C) ඉන්දියාවේ කුරු ක්ෂේත්‍රයේ සිදු වූ මහා සටනක් මෙහි විස්තර වේ.
D) මහා භාරතය ක්‍රි.පූ. 1500- ක්‍රි.පූ. 1000 ක් අතර සියවස්වල හටගත් සිදුවීම සම්බන්ධයෙන් වැදගත් වේ. (.....)

33. මගධ රාජ්‍යයේ බිම්බිසාර රජතුමා
A) මගධයේ පළමුවන වැදගත් රජු මෙතුමාය.
B) දේශපාලනය පිළිබඳ දූරදක්නා නුවණින් කටයුතු කළේය.
C) විවාහ සබඳතා මගින් රාජ්‍ය ව්‍යප්ත කර ගැනීමට කටයුතු කළේය.
D) ක්‍රි.පූ. 8 වන ශත වර්ෂයේ දෙවන භාගයේ මෙතුමා මගධයට පැමිණියේ ය. (.....)

34. ගුප්ත යුගයේ ආගමික පසුබිම,
A) ගුප්ත යුගයේ බ්‍රාහ්මණ ආගම පිරිහීමට පත්විය.
B) භගවත් ගීතාව ජෛන ආගමික ග්‍රන්ථයකි.
C) බුදුන් වහන්සේ විෂ්ණු දෙවියන්ගේ දසවෙනි අවතාරය ලෙස සලකයි.
D) සංඛාරිකා දර්ශනය, යෝග දර්ශනය අටුවාව, මෙකල රචනා විය. (.....)

35. චාලුක්‍ය හා පල්ලව ගැටුම්
A) මෙම දෙපිරිස අතර නිතරම ගැටුම් ඇති විය.
B) I නරසිංහවර්මන් රජු 'මාමල්ල' නම් විරුදාවලිය ලැබුවේය.
C) II පුලකේශීන්ගේ මරණින් පසු උතුරේ චාලුක්‍ය බලය වර්ධනය විය.
D) I පරමේශ්වර්මන්ගේ ක්‍රි.ව. 690 - 700 කාලයේ පල්ලව බලය දුර්වල විය. (.....)



www.artsapi.lk

Scanned by CamScanner

- 36 සිට 40 දක්වා ප්‍රශ්නවල අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4, හා 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | නිවැරදිය |
| 2. නිවැරදිය | වැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ගන්ධාර කලා කෘති හමුවන්නේ වයඹ දිග ඉන්දියාවේ හා ඇෆ්ඝනිස්ථානයේය. | ක්‍රි.ව. 10 වෙනි සියවසේ දකුණු ඉන්දියාවේ කළ්‍යාණියේ චාලුක්‍යයන් රාජ්‍යයක් ගොඩනැංවීය. (.....) |
| 37. වික්‍රමශීලා විශ්ව විද්‍යාලය සාදවන ලද්දේ බෙංගාලයේ ධර්මපාල රජුය. | බුදු දහම හැදෑරීමේ ආයතන පනහක් සමග මේ රජු විසින් කරවන ලදී. (.....) |
| 38. පළමුවන නරසිංහ වර්මන් රජු පල්ලව රජවරුන් අතර 'ශ්‍රේෂ්ඨතමයා' ලෙස සැලකේ. | පල්ලව රජවරු ශිව හා විෂ්ණු භක්තිකයෝ වූහ. (.....) |
| 39. I චන්ද්‍ර ගුප්ත විවාහ සම්බන්ධතා අධිරාජ්‍ය ව්‍යාප්ති කර ගැනීමට උප ක්‍රමයක් ලෙස භාවිතා කළේය. | සමුද්‍ර ගුප්තට පසු ඔහුගේ පුත් II චන්ද්‍රගුප්ත බලයට පත්විය. (.....) |
| 40. II චන්ද්‍රගුප්ත රජ දවස හූණයන්ට විරුද්ධ සටන් කොට පැරදවීය. | ඉන්දියාවට හූණ ආක්‍රමණ එල්ල කරන ලද්දේ ඩිමෙට්‍රියස්ගේ ප්‍රධානත්වයෙනි. (.....) |

www.artsapi.lk



Scanned by CamScanner

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

Provincial Department of Education - NWP

25A | S | II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018 1280

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................

# ඉන්දියා ඉතිහාසය II

**උපදෙස්**

- **පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

- **පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා ඉන්දියාවේ දළ සිතියමක් සපයා ඇත.**

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලු ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) | මොහෙන්දජොදාරෝ | (v) | බැරෝඩා |
| (ii) | සුප්පාරක | (vi) | අයිහෝල් |
| (iii) | තප්ති ගඟ | (vii) | කාවේරි පටුන |
| (iv) | සුලෙයිමාන් කඳුවැටිය | (viii) | උජ්ජෙයිනි |

නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි. (ල.18)

02. ඉන්දියානු ඉතිහාසය හැඩගැන්වීමෙහිලා වයඹ දිග කපොලු බලපෑ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 14)

03. බිම්බිසාර රජුගේ සිට අශෝක රජුගේ පාලන සමයේ අවසාන දක්වා මගධයේ නැගීමට තුඩුදුන් සාධක කවරේදැයි පරීක්ෂා කරන්න. (ල. 14)

04. මොහොන්ජොදාරෝ - හරප්පා ශිෂ්ටාචාරය ලොව පැරණිම නාගරික ශිෂ්ටාචාරවලින් එකකි.

(i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවල මුල් අවධියේ දී කැණීම් කළ පුරා විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(ii) මොහෙන්ජොදාරෝ හා හරප්පා නගර අසලින් ගලායන ගංගා දෙක නම් කරන්න. (ල. 2)

(iii) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)

(iv) ඉහත සඳහන් ප්‍රකාශය නගර සැලැස්ම කෙරෙහි විශේෂ අවධානයක යොමු කරමින් පරීක්ෂා කරන්න. (ල. 7)

05. "චන්ද්‍රගුප්ත මෞර්ය ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යා විය" මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ල. 14)

06. ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටීමට ප්‍රධාන සාධකය වූයේ හූණ ආක්‍රමණයන්ය.'

(i) ගුප්ත අධිරාජ්‍ය බිඳ වැටෙන අවධියේ එහි සිටි පාලකයා සහ ගුප්ත අධිරාජගේ අවසාන පාලකයා නම් කරන්න. (ල. 2)

(ii) ගුප්ත අධිරාජ්‍යයට ආක්‍රමණ එල්ල කළ හූණ නායකයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 4)

(iii) හූණයන් විසින් අල්ලා ගත් ගුප්ත රාජ්‍ය ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ල. 3)

(iv) ගුප්ත අධිරාජය පරිහානිය ඉහත ප්‍රකාශය ඇසුරෙන් විස්තර කරන්න. (ල. 7)



Scanned by CamScanner

07. අශෝක අධිරාජ්‍යයාගේ අරමුණ වූයේ මහජන සුභ සාධනය අරමුණු කොටගත් රාජ්‍යයක් ගොඩනැගීමයි'' මෙය විස්තරාත්මක සාකච්ඡා කරන්න. (ල. 14)

08. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම දෙකකට ඓතිහාසික සටහන් ලියන්න.

(i) වයඹ දිග ඉන්දියාවට එල්ල වූ අරාබි ආක්‍රමණ

(ii) ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ සොළොස් මහා ජනපද

(iii) ගුප්ත පාලකයන්ගේ සාහිත්‍ය

(iv) කුෂාණයන් යටතේ බෞද්ධ සංස්කෘතික අභිවර්ධන

09. එක්කෝ A කොටසට නැතහොත් B කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) චෝළ පරිපාලනයේ දක්නට ලැබෙන මුඛ්‍ය ලක්ෂණ පරීක්ෂා කරන්න.

නැතහොත්

(B) කාංචියේ පල්ලවයන් යටතේ සිදු වූ සංස්කෘතික අභිවර්ධනය විස්තර කරන්න.

(ල. 14)

www.artsapi.lk

Scanned by CamScanner